# ජාතික රාජ්‍ය සභාවේ
# 1974 අංක 41 දරන
# සෙරෙන්ඩිබ් සූපි අධ්‍යයන කවය
# පනත

[සහතිකය සටහන් කළේ 1974 නොවැම්බර් මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

1974 දෙසැම්බර් මස 13 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 41 දරන සෙරෙන්ඩිබ් සූපි අධ්‍යයන කවය පනත

[සහතිකය සටහන් කළේ 1974 නොවැම්බර් මස 27 වන දින]

එල්. ඩී.—ඕ. 30/74

**සෙරෙන්ඩිබ් සූපි අධ්‍යයන කවය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"සෙරෙන්ඩිබ් සූපි අධ්‍යයන කවය" යනුවෙන් නම් කෙරුණු හා හඳුන්වනු ලැබූ සමිතියක් එහි සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව එකී කවයට සම්බන්ධ සියලු කටයුතු ඵලදායී ලෙස කර ගෙන යාමේ හා කිරීමේ කාර්යය සඳහා ෂෙයික් මොහොමඩ් මුහියදීන් ගුරු බාවා පූජක උතුමාණන්ගේ අනුශාසනය යටතේ මෙතෙක් කල් කොළඹ පිහිටුවා තිබෙන හෙයින් ද: පූර්විකාව.

එකී කවය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද එකී විවිධ පරමාර්ථ හා කරුණු එකී කවය විසින් මේ දක්වා සාර්ථකව කර ගෙන ගොස් හා ඉටු කර ඇති හෙයින් ද සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීමට ඉඩදීම මහාජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 41 දරන සෙරෙන්ඩිබ් සූපි අධ්‍යයන කවය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ආරම්භ වීමේ දින සිට හා ඊට පසු (මෙහි මින් මතු "කවය" යනුවෙන් සඳහන් කරනු ලබන) සෙරෙන්ඩිබ් සූපි අධ්‍යයන කවයේ දැනට සාමාජිකයන්ව සිටින යම් හා සිටිනතාක් සාමාජික යෝ හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට මින් මතු ඇතුළත් කර ගනු ලබන සාමාජිකයෝ "සෙරෙන්ඩිබ් සූපි අධ්‍යයන කවය" යන අභිධානය හා නාමය යටතේ අඛණ්ඩ පැවැත්මක් සහිත ව සංස්ථාවක් වන්නාහ. තව ද එකී නාමයෙන් පොදු මුද්‍රාවක් තබා ගෙන පාවිච්චි කිරීමේ ද ඔවුන්ගේ කැමැත්ත පරිදි වෙනස් කිරීමේ ද පූර්ව බලය හා අධිකාරය ඇතිව යම් අධිකරණයක නඩු පවරන අවස්ථාවක සංස්ථාව විසින් එනමින් ම නඩු පැවරිය යුතු අතර සංස්ථාවට විරුද්ධව නඩු පවරනු ලබන අවස්ථාවක එනමින් ම නඩු පවරනු ලැබිය යුතුය. සෙරෙන්ඩිබ් සූපි අධ්‍යයන කවය සංස්ථාගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) ෂෙයික් මොහොමඩ් මුහියදීන් ගුරු බාවා පූජක උතුමාණන් විසින් එතුමාගේ ජීවිත කාලය තුළ දී දේශනා කළ සූපි (ධ්‍යාන යෝග) ධර්මයේ ප්‍රතිපත්ති හා පිළිවෙත් ඉගැන්වීම ඇතුළුව සූපි (ධ්‍යාන යෝග) ධර්මයේ දැනුම ලබා ගැනීමට බලාපොරොත්තු වන සියලුම තැනැත්තන් අතර එකී සූපි (ධ්‍යාන යෝග) ධර්මය වර්ධනය කිරීම හා එකී සූපි (ධ්‍යාන යෝග) ධර්මය අධ්‍යයනය කිරීම සහ අවබෝධ කර ගැනීම;

ජ 07595—8,505 (74/6)

(ආ) ෂෙයික් මොහොමඩ් මුහියදින් ගුරු බාවා පූජක උතුමාණන් විසින් දේශනා කරනු ලැබූ හෝ කරනු ලබන හෝ සූපි (ධ්‍යාන යෝග) ධර්මයේ ප්‍රතිපත්ති හා පිළිවෙත් ද යම් සාමාජිකයකුගේ පාණ්ඩිත්‍යයෙන් ඇති වන්නාවූ හෝ ඇති විය හැකි සූපි (ධ්‍යාන යෝග) ධර්මයට අදාළ පර්යේෂණ කටයුතු, වාර්තා හා ලිපි ලේඛන ද මහාජන යහපත තකා සංග්‍රහ කිරීම, පරිවර්තනය කිරීම, පළ කිරීම හා ව්‍යාප්ත කිරීම ;

(ඇ) පහත සඳහන් කාර්යයන්ගෙන් යම් කාර්යයක් හෝ කාර්යයන් වැඩි ගණනක් සඳහා ස්වේච්ඡා පුණ්‍යාධාර සංවිධාන පිහිටුවීම හා පවත්වා ගෙන යෑම :—

(i) දුගියන්ට සහනාධාර දීම ;

(ii) නිවාස, අනාථ ළමා නිවාස, බෙහෙත් ශාලා, වෛද්‍යාධාර පිහිටුවීමෙන් වැන්දඹුවන් හා අනත්දරුවන්, මහල්ලන් හා අනාථයන් රැක බලා ගැනීම ; සහ

(iii) දුගියන්ට, අනාථයන්ට, දිළින්දන්ට හා රෝගීන්ට පෝෂ්‍ය ආහාරපාන හා වෛද්‍යාධාර සැපයීමෙන් සාගින්න, රෝග හා ව්‍යාධි සම්බන්ධයෙන් සහන සැලසීම ;

(ඈ) ශ්‍රී ලංකාව තුළ හෝ විදේශයක ඕනෑම විද්‍යායතනයක දී සූපි (ධ්‍යාන යෝග) ධර්මය පිළිබඳ උසස් අධ්‍යාපනය ලැබීම හෝ පර්යේෂණ පැවැත්වීම සඳහා කුල, ආගම් හෝ ජාති භේදයෙන් තොරව ඕනෑම තැනැත්තකුට මුදලින් ආධාර සැපයීම පිණිස ශිෂ්‍යත්ව අරමුදලක් පිහිටුවීම ;

(ඉ) ෂෙයික් මොහොමඩ් මුහියදීන් ගුරු බාවා පූජක උතුමාණන්ගේ ඉගැන්වීම ඇතුළුව සූපි (ධ්‍යාන යෝග) ධර්මයේ දර්ශනයන් පිළිබඳව හා එයට සම්බන්ධ සියලු කරුණු පිළිබඳ හැදෑරීම හා පර්යේෂණ පැවැත්වීම සඳහා ශ්‍රී ලංකාව තුළ මධ්‍යස්ථානයක් පිහිටුවීම ; සහ

(ඊ) සාමාන්‍යයෙන් ඉහත කී පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමට අවශ්‍ය වන සියලු කටයුතු කිරීම.

4. (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවෙහි තත් කාලයෙහි බල පවත්නා රීතිවලට අනුව,— කළමනාකාර කමිටුව.

(අ) ෂෙයික් මොහොමඩ් මුහියදීන් ගුරු බාවා පූජක උතුමාණන්ගේ ජීවිත කාලය තුළ දී එතුමා විසින් නම් කරනු ලැබ සාමාජිකයන් විසින් තෝරා පත් කර ගනු ලබන කළමනාකාර කමිටුව විසින් ද ;

(ආ) ෂෙයික් මොහොමඩ් මුහියදීන් ගුරු බාවා පූජක උතුමාණන්ගේ ජීවිත කාලයෙන් පසු සාමාජිකයන් විසින් තෝරා පත් කර ගනු ලබන කළමනාකාර කමිටුව විසින් ද

සංස්ථාවේ තත් කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව පරිපාලනය කරනු ලබන්නේ ය.

(2) අනුශාසක තැන්පත් ෂෙයික් මොහොමඩ් මුහියදීන් ගුරු බාවා පූජක උතුමාණන්ට එතුමාගේ ජීවිත කාලය තුළ දී කළමනාකාර කමිටුවේ නිර්දේශය පිට කළමනාකාර කමිටුවේ ඕනෑම සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීමේ ද හිස් වූ තනතුරු පිරවීම සඳහා වෙන යම් තැනැත්තකු නම් කිරීමේද අයිතිය ඇත්තේ ය.

(3) සංස්ථාවේ ප්‍රථම කළමනාකාර කමිටුව, අනුශාසක උතුමාණන් ගෙන් හා මේ පනත ආරම්භ වන දිනයෙහි ධුර දරන කවයේ කළමනාකාර කමිටුවේ වෙනත් සාමාජිකයන්ගෙන් සමන්විත වන්නේ ය.

භාරකාර මණ්ඩලය.

5. (1) සංස්ථාවට අයත් සියලුම දේපළවල භාරකාරත්වය සංස්ථාවේ තත් කාලයෙහි බල පවත්නා රීතිවලට යටත්ව භාරකාර මණ්ඩලයක් සතු විය යුතු ය. එකී භාරකාර මණ්ඩලය,—

(අ) ෂෙයික් මොහොමඩ් මුහියදීන් ගුරු බාවා පූජක උතුමාණන් ගේ ජීවිත කාලය තුළදී එතුමා විසින් ද ;

(ආ) ෂෙයික් මොහොමඩ් මුහියදීන් ගුරු බාවා පූජක උතුමාණන් ගේ ජීවිත කාලයෙන් පසු කළමනාකාර කමිටුව විසින් ද

සංස්ථාවේ තත් කාලයෙහි බලපවත්නා රීතිවලට අනුව පත් කරනු ලබන අතර අවස්ථාවෝචිත පරිදි ඔවුන් ඉල්ලා අස්වන තුරු හෝ මිය යන තුරු හෝ කළමනාකාර කමිටුවේ නිර්දේශය පිට ෂෙයික් මොහොමඩ් මුහියදීන් ගුරු බාවා පූජක උතුමාණන් විසින් ධුරයෙන් ඉවත් කරනු ලබන තෙක් හෝ එකී භාරකරුවන් වශයෙන් ඔවුන් ක්‍රියා කළ යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම භාරකාර මණ්ඩලය මේ පනත ආරම්භ වන දිනයෙහි ධුර දරන භාරකාර මණ්ඩලය වන්නේ ය.

සංස්ථාවේ රීති.

6. (1) සාමාජිකයන්ගේ යම් වාර්ෂික හෝ විශේෂ මහා සභා රැස්වීමකදී හා එකී රැස්වීමට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් යටත් පිරිසෙයින් තුනෙන් දෙකකවත් ඡන්දයෙන් පහත සඳහන් කාර්යයන් සියල්ලම හෝ ඉන් යමක් සඳහා උචිත යැයි සංස්ථාව සලකන මේ පනතේ ප්‍රතිපත්තිවලට හා විධිවිධානවලට ගැළපෙන රීති සංස්ථාව විසින් කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) සාමාජිකයන් බඳවා ගැනීම, ඉල්ලා අස් කර ගැනීම හෝ නෙරපීම ;

(ආ) කළමනාකාර කමිටුවේ, භාරකාර මණ්ඩලයේ, සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ හා සේවකයන් ගේ බලතල, හැසිරීම හා යුතුකම් ;

(ඇ) රැස්වීම්වල දී හා රැස්වීම් කැඳවීමේ දී සහ සංස්ථාවේ කටයුතු කර ගෙන යාමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය ;

(ඈ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම ;

(ඉ) සාමාජිකයන් විසින් ගෙවිය යුතු සාමාජික මුදල් නිශ්චය කිරීම හා එකී සාමාජික මුදල් එකතු කිරීම ; සහ

(ඊ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම හා එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

එකී රීති සාදනු ලැබූ විට සමාන රැස්වීමක දී, (2) වන උපවගන්තියේ නියමයන්ට යටත්ව වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම කළ හැකිය.

(2) තත් කාලයෙහි බලපවත්නා සංස්ථාවේ කිසිම රීතියක් හෝ මින් මතු සම්මත කර ගනු ලබන කිසිම රීතියක් වෙනස් කිරීම, එවැන්නකට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම සංස්ථාවේ විශේෂ හෝ සාමාන්‍ය මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක ඡන්දයෙන් විනා හා ඒ වෙනස් කිරීම, එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම පිළිබඳ යටත්පිරිසෙයින් දින පහළොවකවත් පූර්ව දැන්වීමක් සන්සරණය කිරීමෙන් හෝ ප්‍රවෘත්ති පත්‍රවල පළ කිරීමෙන් සාමාජිකයන් වෙත කරනු ලැබුවේ නම් මිස නොකළ යුතුය.

(3) මේ පනත ආරම්භ වන දිනයෙහි බලපවත්නා කවයේ රීති මේ වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබේ.

**7.** මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ පවත්නා කවයේ සියලුම ණය හා වගකීම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, කවයට අය විය යුතු සියලුම ණය හා ගෙවනු ලැබිය යුතු සාමාජික මුදල් හා දායක මුදල් මේ පනතේ කාර්යයන් සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතුය. *සංස්ථාව විසින් ගෙවිය යුතු ණය හා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ණය.*

**8.** භාරකාර මණ්ඩලයේ සභාපති හා සාමාජිකයන් දෙදෙනකු හෝ සභාපති පැමිණ නොසිටින විට භාරකාර මණ්ඩලයේ සාමාජිකයන් තිදෙනකු ඉදිරිපිට දී විනා සංස්ථාවේ මුද්‍රාව කවර හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර ඔවුන් පැමිණ සිටීමේ ලකුණක් වශයෙන් ඔවුන් විසින් තම නම් සාධන පත්‍රයෙහි අත්සන් කළ යුතුය. එකී අත්සන්, සාක්ෂිකරුවන් වශයෙන් යම් තැනැත්තකු විසින් අත්සන් කිරීමට බාහිර ව විය යුතුය. *සංස්ථාවේ මුද්‍රාව තැබීමේ ක්‍රියා පටිපාටිය.*

**9.** යම් මිළට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු බුදල් බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතු කරනු ලබන චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීමේ හා දැරීමේ හැකියාව හා ශක්තතාව සංස්ථාවට තිබිය යුතු අතර මේ පනතේ කාර්යයන් සඳහා සහ එකී සංස්ථාවේ තත් කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව එකී සියලු දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදුදීමේ, හුවමාරු කිරීමේ හෝ අන් ආකාරයකින් බැහැර කිරීමේ සියලු බලතල ඇතිව සංස්ථාව එකී සියලු දේපළ සතුව සිටිය යුතුය. *සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.*

**10.** මේ පනතේ සඳහන් අයිතිවාසිකම් හා ඒවා අනුව එයින් හෝ ඒවා යටතේ හිමිකම් කියා පාන අයගේ හැර ජනරජයේ හෝ යම් දේශපාලන මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම් කෙරෙහි මේ පනතෙහි අඩංගු කිසිවක් හානිකරවීම හෝ බලපෑම නොවිය යුතුය. *ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.*